බලපෑම් ඇය තම පෑන මෙහෙයවමින් නිර්භීත ලෙස ප්‍රකාශයට පත් කොට ඇති බවට සාධක විරල නොවේ. ඇතැම් විට මෙබඳු කාව්‍ය රචනා කවිත්වයෙන් තොර වූ අවස්ථා ද නැත්තේ නොවේ.

"සඳ මෙන කවා ඇති කළ ලම පැටවුන් ඩ
අද දින පමණා නැත බත උන් රැක ගන් ඩ
සොඳ ගෑණා ජෝන් ඩොයිලි මෙ දිසා මැතිඳුන්ඩ
වැඳ ගන දුක කියම් පිහිටක් ලැබ ගන් ඩ"

දෙවරක් විවාහ වූ ඇය සිය දෙවන සැමියා මිය ගිය පසු දරුවන් සිවු දෙනකු සමග තනි වීම ඇයගේ පෞද්ගලික ජීවිතයේ අමිහිරි අත්දැකීමක් විය. එවන් අසරණ අවස්ථාවකදී ඇය, මාතර දිසාපතිවරයකු ලෙස කටයුතු කළ ජෝන් ඩොයිලි නම් ඉංග්‍රීසි ජාතිකයාගේ පිහිට පතමින් ලියූ කවියකි, ඉහතින් දැක්වූයේ.

පද්‍ය රචනය හුදෙක් රසෝත්පාදනය කරවන හෝ සමාජ යථාර්ථය නිරූපණය කරන හෝ කලා මාධ්‍යයක්ම විය යුතු බව සිතන්නට තරම් මෙම කිවිඳිය මෙවැනි අවස්ථාවන්හිදී අසමත් වී ඇත්තේ තමන් මුහුණ දුන් දුක්බර අත්දැකීම්වල බැරෑරුම් ස්වභාවය නිසාමය. මෙවන් කාව්‍ය ප්‍රබන්ධ කොට ජෝන් ඩොයිලි දිසාපතිවරයා වෙත යැවීමෙන් ඇයට කිසියම් හෝ සහනයක් ලැබුණ බව ද කියවෙයි. ඇයගේ අසරණ බව මෙන්ම කවි රචනාවෙහි හැකියාව ද ගැන සැලකූ දිසාපතිවරයා ඇයට ගමක් දුන් බව කියවෙයි. එය 'නෝනාගම' නමින් හැඳින්වෙන බව ද අද පවතින විශ්වාසයයි.

නොදියුණු සාහිත්‍ය යුගයක් ගෙවී යන අතරතුර, මෙරට සාහිත්‍ය ක්‍ෂෙත්‍රය යළි අස්වද්දන්ට පෙරමුණ ගත් මාතර කවියන් සමග ගජමන් නෝනා කිවිඳිය ද යම් තරමකට හෝ වැදගත් මෙහෙවරක් ඉටු කර ඇත. ආර්ථික අහේනිය විඳ දරාගත නොහැකි වීමෙන් කාව්‍ය මාධ්‍යය පෞද්ගලික අවශ්‍යතා උදෙසා යොදාගත් ඇය අතින් වෙනත් ඇතැම් අවස්ථාවලදී රචනා වූ සුන්දර කාව්‍ය රචනා ද වෙයි. ස්වභාව සෞන්දර්යයේ මිහිරි බව රසවත් ලෙසත් නිර්මාණාත්මක ලෙසත් කවියට නගන්නට ඇය දක්‍ෂ වූ අවස්ථාවක එක් ප්‍රතිඵලයක් ලෙස, අද පවා ජනප්‍රියත්වයට පත් වී තිබෙන මතු දැක්වෙන කවි පෙළ සාක්‍ෂි සපයයි.

'දෙනිපිටියේ නුගරුක' නමින් ඇය නම් කළ මෙම කවි පෙළෙන් ඝනව වැඩුණ නුග රුකක ස්වාභාවික සුන්දරත්වය සැබවින්ම ඉස්මතු කෙරෙයි.



"පිනවන දුටු දන සෑම - ගඟ ළඟ පිහිටි කදීම
තුරු පෙළ අවට සැදීම - යුත් සෙවනැල්

ගන මේ කුළෙවි දිලීම . විහඟුන් මත රැව් දීම
සුළඟින් පත් ලෙළ දීම . ඇති හැම කල්

යන එන දන නොවැ මැල්ල -සුරිඳුන් වැඳ නොපැකිල්ල
වැස ඉඳ ගිම් සැනසිල්ල - කරති සිතින්"

දකුණු ලක, වැලිගම දෙනිපිටිය නම් ග්‍රාමයෙහි පිහිටා තිබූ (මෑතක් වනතුරුම යම් තරමකට හෝ ඉතිරිව තිබූ) මහා නුගරුකෙහි දර්ශනීය බව හා අවට පරිසරයෙහි සුන්දරත්වය ද ඉස්මතු කරමින් ඇය අතින් නිම වූ මෙම පැදි පෙළ සැබවින්ම බාල වියේදී ඇය ප්‍රකට කළ කවිත්වයෙහි පසු ලකුණු කියා පාන්නකි. දෙනිපිටියේ ගම අසල ගලා යන ගං ඉවුර සමීපයෙහි, මැනවින් සෙවණ දෙන සේ පිහිටි මෙම මහා වෘක්‍ෂය, එය පසු කොට යන එන්නන්ට සිහිල් සෙවණ ලබා දුන් මනරම් ස්ථානයක් ලෙස මෙම කවිය කියවන්නගේ සිත් තුළ මැවී පෙනෙනු ඇත.

සිහිල් සුවය ගෙන එන මඳ පවන සමග එහි දර්ශනය වන මෙම මහා වෘක්‍ෂය ගැන කවියෙන් වර්ණනා කරන්නට කිවිඳිය යොදාගෙන ඇති පද මාලාව සැබවින්ම අගනේය. ඇය සතු භාෂා ඥානය ප්‍රකට කරන වචන රාශියක් මෙම කාව්‍ය නිර්මාණයෙහි දක්නට ඇත. "ගන මේ කුළෙවි", "විහඟුන් මත රැව් දීම" යනාදී යෙදුම්වල ඇති පද ගැළපීම ගජමන් නෝනා කිවිඳිය මාතර යුගය බැබළවූ කුඩා මිණි පහනක් ලෙස නම් කිරීමට උපකාරී වෙයි. ජීවිතය පුරාම මිහිරි අමිහිරි, ප්‍රීතිමත් . දුක්බර අත්දැකීම් සමුදායක් විඳගනිමින්ම මාතර සාහිත්‍යයේ ආලෝකය යන්තමින් හෝ දල්වා ලීමට සමත් වූ කිවිඳියක් ලෙස, දෝන ඉසබෙලා පෙරුමාල් කොරණේලියා හෙවත් ගජමන් නෝනා හැඳින්විය හැකිය.




